**<u>දිනූ සොඳුරු විරු දෙරණේ කලා කෙතේ මල් පීදේ</u>**

**<u>නිවුණු, හැදුණු, පිරුණු, සොඳුරු මිනිසුන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩ නගමු</u>**

# <u>“රණවිරු සුවඳ” විරු කලා මංගල්‍යය - 2019</u>

## <u>රණවිරු දූ දරු තරඟ අංශය</u>

| අනු අංකය | තරඟ අංශය | කාන්තා/පිරිමි | වයස් කාණ්ඩය | නිර්ණායකයන් |
|---|---|---|---|---|
| 01 | රණවිරු දූ දරු නර්තන<br>i. ශාස්ත්‍රීය (ඒකල)<br>ii. නිර්මාණ ( ඒකල) | කාන්තා /පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | i. <u>ශාස්ත්‍රීය</u><br>උඩරට, පහත රට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ගෙන් එක් සම්ප්‍රදායක් ඇසුරු කරගෙන<br><br>ii. <u>නිර්මාණ</u><br>නර්තන නිර්මාණයේ ප්‍රශස්ත බව, චලන ඖචිත්‍ය, ගායන/ වාදන/ නර්තන සමායෝජනය ප්‍රාසාංගික බව සඳහා මෙහිදි අවධානය යොමු කෙරේ. නිර්මාණය අවමය විනාඩි 4 ක් සහ උපරිමය විනාඩි 6 ට සීමා විය යුතුයි. (CD පට භාවිතා කළ හැකිය) |
| 02 | බෙර වාදනය (ඒකල) | කාන්තා/පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | උඩරට, පහතරට, සබරගමු බෙර හා තම්මැට්ටම් වාදනය සඳහා යොදා ගත හැකි අතර, ඒ ඒ සම්ප්‍රදායන්ට අයත් ශාස්ත්‍රීය පද කොටස් ඇතුලත් කොට ගත් ප්‍රාසාංගික නිර්මාණයක් ඉදිරිපත් කල යුතුය. නිර්මාණය අවමය විනාඩි 3 ක් සහ උපරිමය විනාඩි 5 ට සීමා විය යුතුයි. |
| 03 | රණවිරු දූ දරු ගායනය | කාන්තා/<br>පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | ශාස්ත්‍රීය හෝ සරල ගී ඉදිරිපත් කිරීමට හැකිය. |
| 04 | රණවිරු දූ දරු වාදනය | කාන්තා /පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | පෙරදිග/අපරදිග සංගීත භාණ්ඩ අතරින් ඕනෑම සංගීත භාණ්ඩයක් භාවිතා කළ හැකිය. ඉදිරිපත් කිරීම අවමය විනාඩි 3 ක් සහ උපරිමය විනාඩි 6 ට සීමා විය යුතුයි. |
| 05 | රණවිරු දූ දරු නිවේදක | කාන්තා /පිරිමි | 13 - 18<br>19 -25 | විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙනු ලබන මාතෘකාවන්ට අදාලව නිවේදනය ඉදිරිපත් කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 06 | රණවිරු දූදරු<br>පද්‍ය රචනා<br>**සදැස්/නිසදැස්** | කාන්තා /පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | දිනුව සොඳුරු මව්බිම/ රණවිරු නාමයට ගරු බුහුමන්/ රැකගමු ලක් මාතා/ විරු පිය සෙනෙහස/ (**<u>සදැස්</u> පද්‍ය 6කට නොඅඩු/<u>නිසදැස්</u> පද පේලි 30කට නොවැඩි**) |
| 07 | රණවිරු දූ දරු<br>ජන ගායනා | කාන්තා/පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | හෙළ ජන ගී ඇසුරෙන් ප්‍රාසාංගික ඉදිරිපත් කිරිමක්. නිර්මාණය අවමය විනාඩි 2 ක් සහ උපරිමය විනාඩි 3 ට සීමා විය යුතුයි. |
| 08 | රණවිරු දූ දරු චිත්‍ර<br>ප්‍රමාණය අඟල්<br>24” x 26”<br>(කැමති මධ්‍යයක්<br>භාවිත කළ හැක) | කාන්තා/පිරිමි | 6 -12<br>13 -18<br>19 -25 | i. ආදරය, කරුණාව, දයානුකම්පාව<br>ii. සාමය, සහජීවනය සහ සංහිදියාව<br>iii. පරිසරය හා ස්වභාසෞන්දර්යය<br>iv. ආධ්‍යාත්මික සංවර්ධනය<br>v. විරු අභිමන්<br>vi. වසර 2035 දී ශ්‍රී ලංකාව |

<u>රණවිරු සංසද සාමාජික තරග අංශය</u> (රණවිරු/රණවිරු බිරින්දෑවරු/රණවිරු දෙමව්පිය)

| | | | |
|---|---|---|---|
| 09 | අත්කම් නිර්මාණ/<br>ලී කැටයම් | කාන්තා/පිරිමි | දේශීය අමු ද්‍රව්‍ය ආශ්‍රය කරගත් නිර්මාණයක් විය යුතුය. |
| 10 | පද්‍ය රචනා/<br>**සදැස්/නිසදැස්** | කාන්තා/පිරිමි | මාතෘභූමි ලංකා/රණවිරුවාණෙනි/අභිමත විවෘත මාතෘකාවක් (**<u>සදැස්</u> පද්‍ය 6කට නොඅඩු/<u>නිසදැස්</u> පද පේලි 30කට නොවැඩි**) |
| 11 | ගායනය | කාන්තා/පිරිමි | ශාස්ත්‍රීය හෝ සරල ගී ඉදිරිපත් කිරීමට හැකිය. |
| 12 | වාදනය | කාන්තා/පිරිමි | පෙරදිග අපරදිග සංගීත භාණ්ඩ අතුරින් ඕනෑම සංගීත භාණ්ඩයක් භාවිතා කළ හැකිය. නිර්මාණය අවමය විනාඩි 3 ක් සහ උපරිමය විනාඩි 6 ට සීමා විය යුතුයි. |
| 13 | ජන ගායනා | කාන්තා/පිරිමි | හෙළ ජන ගී ඇසුරෙන් ප්‍රාසාංගික ඉදිරිපත් කිරිමක්. නිර්මාණය අවමය විනාඩි 2 ක් සහ උපරිමය විනාඩි 3 ට සීමා විය යුතුයි. |
| 14 | කෙටි කතා | කාන්තා/පිරිමි | නිදහස් මාතෘකාවක් (තම අභිමතය පරිදි මාතෘකාවක් තොරාගත හැක) |

# "රණවිරු සුවඳ" විරු කලා මංගල්‍යය -2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ රණවිරු සේවා අධිකාරිය සංවිධානය කරනු ලබන **"රණවිරු සුවඳ විරු කලා මංගල්‍යය 2019"** තරඟාවලියේ තරග අංශයන් සඳහා අයදුම්පත් භාර ගැනීම.

❖ **අරමුණ**

මාතෘ භූමියේ උස් නිදහස වෙනුවෙන් තම සොඳුරු යෞවනය කැප කර ඉසිඹු සුවයෙන් කල් ගෙවන රණවිරුවන්ගේ, රණවිරු සංසද සාමාජිකයින්ගේ දූ පුතුන්ගේ හදවත් තුළ සුපහන් සිතුවිලි ජනිත කරවා කායික, මානසික සුවයෙන් සපිරි කුසලතා සහ ආකල්පයන්ගෙන් පරිපූර්ණ වූ නීරෝගීමත් රණවිරු පරපුරක් සමාජගත කිරීම.

1. **අයදුම්කිරීම**

   මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සකස් කර ගත් අයදුම්පත් 2019 සැප්තැම්බර් මස 15 දිනට ප්‍රථම තම රණවිරු සංසදයේ නිර්දේශය සහිතව රණවිරු සේවා අධිකාරියේ දිස්ත්‍රික් නිළධාරි තුමා/තුමියට හෝ අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "රණවිරු සුවඳ විරු කලා මංගල්‍යය 2019, තරග අංශය සහ දිස්ත්‍රික්කය සඳහන් කර රණවිරු සේවා අධිකාරිය (පළාත් අංශය) , අංක 449, ගාලු පාර, කොළඹ 03, යන ලිපිනයට යොමු කළ යුතුය.

2. **තරඟ පැවැත්වීම**

   i. පළමු වටයේ තරඟ -දිස්ත්‍රීක්ක මට්ටමින් පවත්වනු ලැබේ.
   ii. අවසන් වටයේ තරඟ -දිස්ත්‍රීක්ක මට්ටමින් ප්‍රථම ස්ථානය ලබාගත් තරඟකරුවන් පමණක් ජාතික තරඟයට කැඳවනු ලැබේ.

3. **තරඟ කාලසටහන**

   i. දිස්ත්‍රික් තරඟාවලිය සැප්තැම්බර් මාසයේදී පැවැත්වේ.
   ii. ජාතික තරඟාවලිය ඔක්තෝබර් මාසයේදි පැවැත්වේ.
   iii. රණවිරු සුවඳ ප්‍රසංගය සමගින් සහතික හා සම්මාන ප්‍රදානෝත්සවය නොවැම්බර් මාසයේදි පවත්වනු ලබයි.

❖ සෑම වසරකම ඉහත සඳහන් කාල පරාසය තුල මෙම වැඩසටහන පැවැත්වීමට නියමිතය.

4. **තරඟ කොන්දේසි**

   i. රණවිරු සේවා අධිකාරියේ රණවිරු සංසද සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
   ii. එක් තරඟකරුවෙකු සඳහා ඉදිරිපත් විය හැක්කේ තරඟ අංශ දෙකක් සඳහා පමණි.
   ( එක් එක් තරඟ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පතත් ඉදිරිපත් කළ යුතුය)
   iii. පටිගත කළ සංගීතය යොදා ගැනීමට නියමිත අංග සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ (CD Player) තමන් විසින් සපයා ගත යුතුය.
   iv. තරඟ අංශයන් සඳහා තමන්ට අවශ්‍ය වන භාණ්ඩ, උපකරණ, ද්‍රව්‍යන් තමා විසින් සපයා ගත යුතුය.
   v. දිස්ත්‍රික් තරඟ සඳහා නර්තන, ගායන, වාදන සඳහා නියමිත රංග වස්ත්‍රාභරණ අදාල නොවේ.

vi. ජාතික තරඟාවලිය සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම තරඟකරුවන් සහ සහාය ගායන හා වාදන ශිල්පීන් උචිත රංග වස්ත්‍රාභරණයෙන් සැරසී සිටිය යුතුය.

vii. නර්ථන/ගායන/වාදන අංශයන්හි සහය ගායන සහ වාදන ශිල්පීන් සහභාගී කරගත හැකි උපරිම සංඛ්‍යාව 05 දෙනෙකි.

viii. පද්‍ය රචනා තරග අංශයෙහි **<u>සඳැස්</u>** පද්‍ය (06 )කට නොඅඩු විය යුතු අතර **<u>නිසඳැස්</u>** පද පේළි (30) කට නොවැඩි විය යුතුය.

ix. දිස්ත්‍රික් තරඟ සඳහා සහභාගි නොවූ ශිල්පීන්ට ජාතික තරඟය සඳහා සහභාගි විය නොහැකිය.

x. තරඟ සඳහා පැමිණෙන සියළුම තරඟකරුවන්ගේ වයස් සීමාවන් තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය තරග පැවැත්වෙන දිනයේදි ඉදිරිපත් කළ යුතුය. තරඟ අයදුම්කරුවන්ගේ වයස් සීමාව 2019 දෙසැම්බර් 31 වන දිනට සම්පූර්ණ වී තිබිය යුතුය.

xi. ඉහත සඳහන් තරඟ කොනදේසි උල්ලංඝනය කරනු ලබන තරඟකරුවන් තරඟයෙන් ඉවත් කෙරේ.

xii. අනු අංක 06, 08 , 09 , 10 සහ 14 තරඟ අංශයන් සඳහා **<u>ඉදිරිපත් කරනු ලබන</u>** නිර්මාණ පාසල් ළමුන් සඳහා තම පාසලේ විදුහල්පතිතුමත් **පාසල් නොයන සහ විවෘත අංශයේ** නිර්මාණ සංසද නිළධාරි විසින්(සභාපති/ලේකම්) සහතික කර තිබිය යුතුය.

xiii. රණවිරු සහෝදර සහෝදරියන්ට සහ විවාහක රණවිරු දූ පුතුන්ට මෙම තරඟය සඳහා ඉදිරිපත් විය නොහැක.

xiv. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

5. **<u>ජයග්‍රාහකයින් ඇගයීම</u>**

i. දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලාභීන් සඳහා සහතික පත්‍ර පිරි නැමීම සිදු කරනු ලබයි.

ii. ජාතික තරඟාවලියෙහි ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා සහතික පත්‍ර ද ප්‍රථම ස්ථානය සඳහා පමණක් සම්මාන, තිළිණ ප්‍රදානයද සිදු කරන අතර 2019 නොවැම්බර් මස තුල **රණවිරු සුවඳ ප්‍රසංගය සමග සම්මාන උළෙල** පවත්වනු ලැබේ.

## "රණවිරු සුවඳ" විරු කලා මංගලාය - 2019

## අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :-..........................................................................................................

2. ලිපිනය :-..........................................................................................................

3. වයස :-2019.12.31 දිනට වයස අවු: ................. මාස :-............. දින:-...................

4. දිස්ත්‍රික්කය :-................................................... පළාත :-.............................................

5. රණවිරු ඥාතීත්වය :- දූදරු ☐ රණවිරු ☐ බිරිඳ ☐ මව ☐ පියා ☐

5. රණවිරුවාගේ නම:-.......................................................................................................

6. සේවා අංකය : ...........................................................................................................

7. සේවාව :-යුධ ☐ නාවික ☐ ගුවන් ☐ පොලිස් ☐

8. රණවිරුවාගේ ස්වභාවය :- දිවිපිදූ ☐ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ ☐

9. දිවිපිදූ දිනය :-........................................... ස්ථානය :-....................................................

10. තරඟ අංශය සහ අංකය :-..............................................................................................

11. දූරකථන අංකය :-.........................................................................................................

12. නර්තන/ගායන/වාදන අංශ සඳහා ඉදිරිපත් වන සහායක නාම ලේඛනය
(අවශ්‍යතාවය පරිදි) :-..........................................................
:-..........................................................
:-..........................................................
:-..........................................................
:-..........................................................

දිනය :-........................................ අයදුම්කරුගේඅත්සන:-.....................................

## සහතික කිරීම

**...................... රණවිරු සංසදයේ සාමාජිකයකු වන ..............................................යන අය/ යන අයගේ රණවිරු පුතා/දුව වන ........................................................ඉහත ඉල්ලුම් කර ඇති තරග අංශය සඳහා සුදුසුකම් ලත් තරඟකරුවෙකු/තරඟකාරියක බව සහතික කරමි.**

දිනය:.......................... .....................................

අත්සන/මුද්‍රාව
රණවිරු සංසද සභාපති/ලේකම්

(මෙම අයදුම්පතේ ඡායා පිටපත් කඩිනමින් සංසද සාමාජිකයින් වෙත ලබා දීමට කටයුතු කරන්න)